# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

**අංක 2492/34 – 2026 ජුනි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2026.06.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/02/2024/58

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.04 දිනැති හා අංක 2430/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.03.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කළුතර, කලමුල්ල, කන්‍යාරාම පාර, "ප්‍රියන්දි" හි පදිංචි කේ. ඒ. ජගත් පී. පෙරේරා මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ගාලු පාර, අංක 80 පිහිටි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 21/2025 හා 2026.03.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මැයි මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දීය**

කේ. ඒ. ජගත් පී. පෙරේරා මයා,
"ප්‍රියන්දි", කන්‍යාරාම පාර,
කලමුල්ල,
කළුතර.

පැමිණිලිකරු

ආරාවුල් අංකය - IR/COM/02/2024/58
බේරුම්කරණ අංකය : A/21/2025

එදිරිව

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය,
අංක 80, ගාලු පාර,
කොළඹ 03.

වගඋත්තරකරු

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :

"ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සේවය කරනු ලබන කේ. ඒ. ජගත් පී. පෙරේරා මහතාට 2010 මාර්තු 23 දින සිට කණිෂ්ඨ කළමනාකරු තනතුර සඳහා හිමිකමක් තිබේද? යන්නත් එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳ වේ."

**පළමු පාර්ශ්වයේ නෛතික ස්ථාවරය:**

පළමු පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශ මගින් සාක්ෂි ලබා දෙමින් සහ ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශ කොට ඇත.

පැමිණිලිකාර පළමු පාර්ශ්වය ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ප්‍රසිද්ධ කරනු ලැබූ දැන්වීමකට අනුව අයදුම් කිරීමෙන් පසුව එකී ආයතනයේ තුන්වන ශ්‍රේණියේ පාරිභෝගික සම්බන්ධතා නිලධාරි / ප්‍රවෘත්ති සහායක තනතුරට 2008.07.07 දින බඳවා ගනු ලැබූ බවත්, ඉල්ලුම්කරු එසේ සේවය කරමින් සිටිය දී 2010 වර්ෂයේ දී සංචාරක මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී පිහිටුවන ලද ආයතන හතරෙන් එකක් වන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත 2010.12.14 දින සිට අන්තර්ග්‍රහණය කරනු ලැබූ බවත් කියා සිටී.

ඉල්ලුම්කරු සහ වගඋත්තරකාර ආයතනය අතර ඇති වී තිබෙන ආරාවුලට ප්‍රධාන හේතුව වශයෙන් බලපාන ලද්දේ මෙම අන්තර් ග්‍රහණය සිදු කරන අවස්ථාවේ දී ඉල්ලුම්කරු ඔහුගේ සුදුසුකම්වලට සරිලන ආකාරයේ තනතුරක පිහිටු වීමට කටයුතු නොකිරීම බව ඉල්ලුම්කාර පාර්ශ්වය කියා සිටී. එකී අන්තර්ග්‍රහණය මගින් ඉල්ලුම්කරු දැරූ තනතුරු නාමය වෙනස් වීමත් සමග ඉල්ලුම්කරුට ලැබිය හැකි ඉදිරි අවස්ථා අහිමිවී ගිය බවත් දක්වා සිටී.

ඉල්ලුම්කරු එකී තනතුරට අන්තර්ග්‍රහණය සිදු කිරීම සම්බන්ධයෙන් විරෝධය පැමක් වශයෙන් අයදුම් පත්‍රයේ පාද සටහනක් යොදමින් එකී විරෝධය සඳහන් කළ බව කියා සිටී.

(හරස් ප්‍රශ්න : 2025.06.05 දින කාර්ය සටහන් 20 - 21 පිටු)

ප්‍ර. එතකොට සාක්ෂිකරු ඔය ලේඛනයේ කොහේ හරි සඳහන් කරලා තියෙනවාද තමුන් අකමැත්තෙන් මේක අත්සන් කළා කියලා ?
පි. මෙතෙක් කිසිදු උසස්වීමක් ලැබුණේ නැහැ කියලා මම මෙතන බොහොම පැහැදිලිව සඳහන් කරලා තියෙනවා.

ප්‍ර. උසස් වීමක් ලැබුණේ නැහැ කියන කරුණු හැරුණු කොට මේ ලේඛනය බලෙන් ලියලා අත්සන් කර ගත්තා කියලා තියෙනවද කොහේ හරි?

පි. බලහත්කාරකමක් නොවේ. මම අත්සන් කළා අත්සන් කළ යුතු නිසා. මොකද හේතුව මගේ ජොබ් එක අන්තර්ග්‍රහණය කළ නිසා මම අකමැත්තෙන් හරි අත්සන් කරන්න සිදු වුණා. බලහත්කාරකමක් කලා කියන්න බැහැ. මොකද මගේ පෞද්ගලිකවම ලැබිය යුතුයි. ඒ කාරණා නිසා මම අත්සන් කළා. නමුත් මම මගේ විරෝධය දක්වා සිටියා මං 3 වන ශ්‍රේණියට දාද්දි ලොකු වරදක් තියෙනවා කියලා මම පැහැදිලිව මගේ විරෝධතාව පෙන්වා සිටියා ........

ප්‍ර. දැන් සාක්ෂිකරු ඔබ ලේඛනයේ අන්තිම ඡේදයේ මොකක් ද සඳහන් වෙලා තියෙන්නේ තමුන් විසින් සඳහන් කළ ඡේදයේ මොකක් ද සඳහන් වෙලා තියෙන්නේ. ඒක කියවා සිටින්න සාක්ෂිකරු ?

පි. සාක්ෂිකරු එම අදාළ කොටස කියවා සිටී. මම වෙනම නෝට් එකක් දාලා මම කියන්න උත්සාහ කරන්නේ මේ පත්වීම සම්බන්ධව මාගේ විරෝධය බොහොම තදින් තිබුණා කියලා තමයි මම කියන්න උත්සාහ කරන්නේ.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් ලකුණු කරන ලද R6 ලේඛනය වන අන්තර්ග්‍රහණය වීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් ලබාදෙන ලද අයදුම් පත්‍රයේ තරු (*) ලකුණක් යොදා ශ්‍රේණිගත උසස්වීමක දී අදාළ තනතුර සේවා කාලය පළමු පත්වීම් දිනය සලකනු ඇතැයි විශ්වාස කරමි." ලෙස පාද සටහනක් යොදා ඇති බව නිරීක්ෂණය වන අතර එය R6a ලෙස ලකුණු කර ඇත.

ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය මගින් ඇමුණුම් අංක 9 ලෙස ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති පී. එම්. විතාන මහතා විසින් 2015 දෙසැම්බර් 16 දිනැති සංචාරක හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමිය වෙත යොමු කරන ලද ලිපියේ දක්වා ඇත්තේ “ජගත් පෙරේරා මහතා අප ආයතනයේ සංචාරක තොරතුරු මධ්‍යස්ථාන, ප්‍රසම්පාදන, ගබඩා, අලෙවි යනාදී වශයෙන් අංශ කිහිපයකම සේවය කර ඇති අතර දැනට අප කාර්යාංශයේ අලෙවි අංශයේ ස්කැන්ඩිනේවියානු සහ ඔස්ට්‍රියානු වෙළඳ පොළට අදාළ විෂයන්වල ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි’’ යනුවෙන් දක්වා ඇත. එකී ලිපිය මගින් තවදුරටත් ඉල්ලා සිටිනුයේ ජගත් පෙරේරා මහතා කණිෂ්ඨ කළමනාකරු සංචාරක තොරතුරු මධ්‍යස්ථාන, යන තනතුරට උසස් කිරීමට අවශ්‍ය නිර්දේශයන් හා අනුමැතිය ඔහුට පෞද්ගලික වන ලෙස හෝ ලබා දෙන ලෙසයි.

තවද, ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයේ 8 වගන්තියේ දක්වා සිටිනුයේ 2009 සිට 2022 දක්වා කාලය තුළ බඳවා ගැනීමේ හා උසස්වීම්, අනුමත වූ බඳවා ගැනීමේ පටිපාටිය හා අභ්‍යන්තර උසස් කිරීමට පරිබාහිරව, සාධාරණ හා නිත්‍යානුකූල නොවන උසස්වීම්, නිලධාරීන් කිහිපදෙනෙකුට පමණක් ලබා දී ඇති බවයි.

(හරස් ප්‍රශ්න : 2025.06.05 දින කාර්ය සටහන් 37 - 38 පිටු:)

ප්‍ර. එතකොට තමුන් අයදුම් කළ තනතුර සම්බන්ධයෙන් නොව ඊට පෙර අයදුම්පත් භාර ගන්නා දෙයක් සම්බන්ධයෙන් තමයි මේ දෙය සඳහන් වෙලා තියෙන්නේ?

පි. නමුත් මේකම රිෆර් කරලා ඉවර වෙලා මේ 3 රිෆර් කරලා ඉවර වෙලා මේ එස් ඕ ආර් එකට අවුරුදු 9 ක් පස්සට බැක්ඩේට් කරලා ආයතනයේ කට්ටියට උසස්වීම් දීලා තියෙනවා. එය ඔප්පු කරන්න පුළුවන්. ඒක ඔඩිට් ජෙනරාල් එකෙන් නිකුත් කළ ලේඛනයක්. මම ඒක පැහැදිලිව ඉදිරිපත් කරලා තියෙනවා.

(හරස් ප්‍රශ්න : 2025.06.05 දින කාර්ය සටහන් 39 පිටුව)

ප්‍ර. එතකොට දැන් තමුන් කියන්නේ නීති රීතිවලට අනුකූල නොවී තමුන්ට මේ තනතුර ලබා දෙන්න කියලා ද?

පි. ඔව්. ආයතනයක් වුණාටම ඔක්කොටම එක විදියකට සලකන්න ඕනේ. කට්ටියකට එක විදියකටත් තවත් කට්ටියකට තවත් ......... (පිළිතුර සම්පූර්ණ නොකරයි.)

**දෙවන පාර්ශ්වයේ නෛතික ස්ථාවරය :**

දෙවන පාර්ශ්වය සාක්ෂි ලබා දෙමින් සහ ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශ කොට ඇත.

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ඉල්ලුම්කාර පාර්ශ්වය 2007.03.15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ III ශ්‍රේණියේ පාරිභෝගික සම්බන්ධතා / ප්‍රවෘත්ති සහායක තනතුරට පත් කර ඇති බවත්, 2005 අංක 38 දරන සංචාරක පනත (2008 වසරේ සිට බලාත්මක වන) මගින් සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය පිහිටුවා ඇති බවත්, ඉල්ලුම්කරු දෙවන පාර්ශ්වය වෙත සේවා අන්තර්ග්‍රහණය කර ඇති බවත්, ඉල්ලුම්කරුගේ පරිවාස කාල සීමාවෙන් පසුව 2010.03.23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කරු

සේවයේ ස්ථිර කර ඇති බවත්, ඉල්ලුම්කරු විසින් 2024.03.26 දිනැතිව කණිෂ්ඨ කළමනාකාර තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කර තිබූ බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව ඉල්ලුම්කරු 2025.01.01 දින සිට කණිෂ්ඨ කළමනාකාර (උපායමාර්ගික සැලසුම් හා පර්යේෂණ) II ශ්‍රේණියට පත්වීම් ලබා දී ඇති බවත්. 2010.03.23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කණිෂ්ඨ කළමනාකාර II ශ්‍රේණියේ තනතුර ලබාදෙන ලෙස ඉල්ලීම් කළ ද, ඒ වන විට මෙම පළමු පාර්ශ්වය එකී තනතුරට අදාළව බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් සුදුසුකම් සපුරා නොමැති බවත් වගඋත්තරකාර ආයතනයේ ලිඛිත දේශනය මගින් දක්වා සිටී.

වගඋත්තරකාර ආයතනය කියා සිටිනුයේ R21 ලෙස ලකුණු කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ කණිෂ්ඨ කළමනාකාර (උපායමාර්ගික සැලසුම් හා පර්යේෂණ) තනතුරට අදාළ R21 (a) ලෙස ලකුණු කර ඇති සුදුසුකම් 2010.03.23 දින වන විට ඉල්ලුම්කරු සපුරා නොමැති බවත් එම දින සිට එකී තනතුර ලබා ගැනීමට හිමිකමක් නොමැති බවත් ය.

(වගඋත්තරකාර පාර්ශ්වයේ මූලික සාක්ෂි 2025.10.02 දින කාර්ය සටහන් - 22 පිටුව)

ප්‍ර. දැන් මහත්මිය කලින් ප්‍රකාශ කළා මේ පළමු පාර්ශ්වය 2010 වර්ෂය වන විට හිටියේ එම් එම් ග්‍රේඩ් 3 කියන ශ්‍රේණියේ කියලා නිවැරදිද?

පි. ඔව්

ප්‍ර. එම් එම් ග්‍රේඩ් 3 ශ්‍රේණියෙන් පසුව ලබන උසස්වීම මොකක්ද ?

පි. එම තනතුරේම ග්‍රේඩ් ප්‍රෙමෝෂන් එක ඊලඟට ග්‍රේඩ් 2 එක තමයි හම්බ වෙන්නේ.

ප්‍ර. එතකොට මහත්මිය මේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව එම් එම් ග්‍රේඩ් 3 ඉන්න සේවකයෙකු හට ජේ එම් තනතුරකට යාමට හැකියාවක් තියෙනවද?

පි. ස්වාමිණි මේ බඳවා ගැනීමේ පටිපාටියේ අභ්‍යන්තර සහ බාහිර වශයෙන් සුදුසුකම් තියෙනවා.

(වග උත්තරකාර පාර්ශ්වයේ මූලික සාක්ෂි 2025.10.02 දින කාර්ය සටහන් - 23, 24 පිටු)

ප්‍ර. එතකොට මහත්මිය ග්‍රේඩ් 3 එකේ සිට ග්‍රේඩ් 2 එක යම් කිසි සේවකයෙකුට උසස්වීමක් ලබන්න තියෙන්න ඕනේ සුදුසුකම් මොනවාද අභ්‍යන්තර අයදුම්කරුවෙක් සඳහා ?

පි. ඇවරේජ් ප්‍රොෆෝමර් කෙනෙක් ලෙස අවුරුදු 10 ක එන්ග්‍රිමන්ට් 10 ක් උපයාගෙන තිබිය යුතුයි. ඊට අමතරව ඊ බී පාස් වෙලා තියෙන්න ඕනේ කාර්යක්ෂමතා කඩ ඉම පාස් වෙලා ඉන්න ඕනේ. දෙවන භාෂාවේ ප්‍රවීණතාවය ලබාගෙන තිබිය යුතුයි.

ප්‍ර. මේ බඳවා ගැනීමේ පටිපාටියේම සඳහන් වෙනවා ද එම් එම් ග්‍රේඩ් 2 ඉන්න සේවකයෙකුට එම් එම් ග්‍රේඩ් 1 එකට යන්න අවශ්‍ය කරන සුදුසුකම් මොනවාද කියලා ?

පි. ඔව් ස්වාමිණි, මෙම බඳවා ගැනීමේ පටිපාටියට අනුවත් අවුරුදු 10 ක් ග්‍රේඩ් 2 තනතුරේ සේවය කරලා සැලරි එන්ග්‍රිමන්ට් 10 ක් උපයා ගැනීමෙන් පසුව තමයි යන්න පුළුවන් ඊළඟ ග්‍රේඩ් ප්‍රොමෝෂන් එකට, එතන දී කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සලකා බලන්න පුළුවන් වෙන්නේ.

ප්‍ර. එතකොට ආයතනයට හැකියාවක් තියෙනවා ද මේ එම් එම් ග්‍රේඩ් 3 ඉන්න සේවකයෙකු හට එම එම් ග්‍රේඩ් 2 ශ්‍රේණි ගත උසස්වීමත් එම් එම් ග්‍රේඩ් 1 කියන ශ්‍රේණිගත උසස්වීමත් ලබා නොදී එක් වරම ජේ එම් ශ්‍රේණිගත උසස්වීමක් ලබා දෙන්න ?

පි. ස්වාමිනී ඇත්තටම කළමනාකරණ සහකාර එම් එම් එකේ සිට ජේ එම් එකට යන කොට අපි අලුත් පත්වීමක් තමයි ලබා දෙන්නේ. එතකොට අයදුම්පත් කැඳවීමකින් තමයි ඒ පත්වීම ලබා දෙන්නේ. සාමාන්‍ය ප්‍රොමෝෂන් එකක් ඇතුළත ජේ එම් ප්‍රොමෝෂන් එකකට යන්න බැහැ. මේකේ අභ්‍යන්තර අයදුම්කරුවන්ටත් සහ බාහිර අයදුම්කරුවන්ට සුදුසුකම් වර්ග දෙකක් තියෙනවා. ඒකේ දී අභ්‍යන්තර අයදුම්කරුවෙක් ලෙස කළමනාකරණ සහකාර 3 ශ්‍රේණියේ සිටින කෙනෙකුට ජුනියර් මැනේජර් තනතුරකට යාමට හැකියාවක් නැත ස්වාමිණි.

වගඋත්තරකාර පාර්ශ්ව ප්‍රකාශ කර සිටිනුයේ සාධාරණත්වයට අනීති කතාවක් සිදු කිරීමට හැකියාවක් නොමැති බවයි. බඳවා ගැනීමේ පටිපාටිය අභිබවා යමින් ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට 2010.03.23 දින සිට අයැද සිටින තනතුර ලබා දීම පටිපාටියට පටහැනි වන අතර එය නීති විරෝධී පත්වීමක් ද වන බවයි.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් අවධාරණය කර ඇති *C.W. Mackie & Co. Ltd. vs. Hugh Molagoda, Commissioner General of Inland Revenue and Others (1986) 1 SLR 300* නඩුවේ දී ශර්වානන්ද අගවිනිසුරුතුමන් විසින් සඳහන් කරන ආකාරයට අධිකරණයට සාධාරණයක් සිදු කිරීම උදෙසා තවත් නීති විරෝධී ක්‍රියාවක් සිදු කිරීමට නියෝග කිරීමට හැකියාවක් නොමැති බවයි.

*"In the exercise of its jurisdiction to grant relief or give such directions as this court may deem just and equitable, this court cannot lend its sanction or authority to any illegal act.* **"Illegality and equity are not on speaking terms".** *"*

තවද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති සමානාත්මතාව පිළිබඳ මූලික අයිතිය පිළිබඳ සලකා බැලීමේ දී පෙර අවස්ථාවක දී නීතිමය නොවන යමක් සිදු වූ පමණින් කිසිදු ආයතනයකට තවත් නීති විරෝධී ක්‍රියාවක් කිරීමට නියෝග කිරීමට අධිකරණයට හැකියාවක් නැති බවද එකී නඩුවේ දී දක්වා ඇත.

"The Article 12(1) does not require the authorities to act illegally in one cas because they have acted illegally in other cases. The Constitution only guarantees equal protection of the law and not equal violation of the law."

එක් නීති විරෝධී ක්‍රියාවක් නිවැරදි කිරීමට තවත් නීති විරෝධී ක්‍රියාවක් සිදුකිරීමට නියෝග කිරීම තුළින් එම ක්‍රියාව සාධාරණීකරණය කළ නොහැකි බව Gamaethige vs. Siriwardene (1988) 1 SLR 384 නඩුවේ දී ද අවධාරණය කර ඇත. Abeywardene vs. Inspector General of Police and Others (1991) 2 SLR 349 මගින් "One illegality does not justify another illegality" ලෙස දක්වා එය තහවුරු කර ඇත.

තවදුරටත් වගඋත්තරකාර ආයතයනය දක්වා සිටිනුයේ පළමු පාර්ශ්වය සඳහන් කරන ආකාරයට අනෙකුත් නිලධාරීන් කිහිප දෙනෙකුට අනීතික ලෙස පත්වීම් ලබා දී තිබුණ බව හුදෙක් තර්කය පිණිස සලකා බැලුව ද එවැනි අසාධාරණ ධනාරෝපණයක් (unjust enrichment) මුල්කර ගනිමින් බේරුම්කරණ අධිකරණයකට තවත් අසාධාරණ ධානාරෝපණයක් නියෝග කිරීමේ හැකියාවක් නොමැති බවයි. ඒ බව Ceylon Pertrolium Storage Terminal Limited vs. Mr. B. K. Prabhath Chandrakeerthi CA Writ 243/2021 (CA minutes 10.02.2022) නඩුවේ දී අවධාරණය කර ඇත.

යම් කිසි උසස් වීමකට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයින්ට වෙනත් පුද්ගලයින්ට එම උසස් වීම් ලබාදුන් පමණින් එම උසස් වීම සඳහා හිමිකමක් ඇති නොවන බව P. D. W. K. Chandrarathne & Other vs. Mahinda Balasuriya & Others (2019) SCLR [SCFR No. 188/2010 SC Minutes 04.09.2019] නඩුවේ දී දක්වා ඇත.

වගඋත්තරකාර ආයතනය තවදුරටත් දක්වා සිටිනුයේ පැමිණිලිකරු සාධාරණත්වය පතා පිරිසිදු දැතින් පැමිණ නොමැති බවත්, නඩුවේ පළමු පාර්ශ්වය විසින් සිය දිවුරුම් ප්‍රකාශයෙහි සහ හරස් ප්‍රශ්න විමසීමේ දී ලබාදුන් සාක්ෂිවල දී අසත්‍ය වූ ද, පරස්පර වූ ද, පැහැදිලි සංදිග්ධතාවයෙන් සමන්විත වූ ද කරුණු ඉදිරිපත් කර ඇති බවයි. "Falsus in uno, falsus in ominibus - False in one thing, false in everthing" ආප්තය අනුව යම් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය සාක්ෂියක් ලබා දෙන සාක්ෂිකරුවෙකු අන් කිසිදු කරුණක් සම්බන්ධයෙන් සත්‍ය ලෙස පිළිගත හැකි සාක්ෂි ලබාදිය හැකි තරම් විශ්වාසනීයත්වයෙන් සතු නොවන බවත් කියා සිටී.

වගඋත්තරකාර ආයතනය දක්වා සිටිනුයේ ඉල්ලුම්කරු කළමනාකරණ සේවා අංක 30 චක්‍රලේඛයෙහි විධි විධානවලට අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙහි කළමනාකරණ සහකාර තෙවන ශ්‍රේණියේ තනතුර සඳහා අන්තර්ග්‍රහණය කිරීමට මෙම පළමු පාර්ශ්වය 2010.10.28 දිනැතිව මනාපය පළ කර ඇති බවත්, R06 ලෙස ලකුණු කර ඇති එම ලේඛනයේ "ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙහි සේවය කරන ජගත් පෙරේරා වන මම 2010.02.09 දින දරන බඳවා ගැනීමේ / උසස්වීමේ පටිපාටිය කියවා තේරුම් ගතිමි. එම සේවයේ සේවා කොන්දේසි හා වගන්තිවලට යටත්ව කළමනාකරණ සහකාර - තෙවන ශ්‍රේණියේ තනතුරට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළ කරමි." ලෙස සඳහන් කර පළමු පාර්ශ්වය විසින් සිය අත්සන තබා ඇති බවත්, එබැවින් නෛතික වශයෙන් " **එස්ටෝපල් මූලධර්මය** " ක්‍රියාවට නැංවීමට අවස්ථාව සලසන බවත්. එම නිසා එකඟ වීමෙන්, ප්‍රතිවිරුද්ධ දේ ප්‍රකාශ කිරීමේ නීත්‍යානුකූල අයිතිය ඉල්ලුම්කරුට අහිමි වන බවත්ය.

තවද, ඉල්ලුම්කරු විසින් පරිසිද්ධීන් අවනිශේදනය කිරීම මගින් සත්‍යය වැරදි ලෙස නිරූපණය කර ඇති බවයි. ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර ඇති ඇමුණුම් 05 ලේඛනය ඉල්ලුම්කරුට අදාළ ලේඛනයක් නොවන බවත්, එහි අයදුම් පත්‍ර භාර ගන්නා දිනය 2005.06.30 ලෙස පැහැදිලිව සඳහන් කර ඇති බවත්, එය මෙම ඉල්ලුම්කරු සංචාරක මණ්ඩලයට බැඳෙන්නට පෙර පැවති අභ්‍යන්තර සේවක උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් වන බැවින් ඉල්ලුම්කරු බේරුම්කරණය නොමග යැවීමට උත්සාහ කර ඇති බවයි.

තවදුරටත් වගඋත්තකාර ආයතනය දක්වා සිටිනුයේ දෙවන පාර්ශ්වය විසින් සිය බඳවා ගැනීමේ පටිපාටිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු කර ඇති බවත් ය.

දෙවන පාර්ශ්වය කිසිදු අවස්ථාවක දී පළමු පාර්ශ්වයට අදාළව අයුක්ති සහගත ලෙස හෝ අසාධාරණ ලෙස කටයුතු කොට නොමැති බවත්, සැම විටම පවතින නෛතික රාමුව තුළ කටයුතු කර ඇති බවත් දක්වා සිටී.

**තීන්දුව**

දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලැබූ වාචික සහ ලේඛනගත සාක්ෂි සහ ලිඛිත දේශන සලකා බැලීමි. පැමිණිලිකාර කේ. ඒ. ජගත් පී. පෙරේරා මහතා විසින් සිය පැමිණිල්ල තහවුරු කිරීමට අපොහොසත් වී ඇති බව තීරණය කරමි. රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සේවයේ යම් තනතුරකට බඳවා ගැනීමේ දී සලකා බලනුයේ එකී තනතුරට දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර තිබේ ද යන්න පමණි. කිසියම් හෝ අයදුම්කරුවෙකුට තනතුරකට බඳවා ගනු ලබන අවස්ථාවේ දී දක්වා ඇති සුදුසුකම්වලට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බැවින්, ඒ හේතුවෙන්ම ඉහළ තනතුරකට හිමිකමක් ඇති නොවේ. අනිත් අතට අතීතිකව යම් පුද්ගලයන්ට උසස්වීම් ලබාදීම මගින් පැමිණිලිකරුට උසස්වීම් සඳහා හිමිකමක් ඇති නොවේ. ඒ අනුව පැමිණිලිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර නඩුව නිශ්ප්‍රභ කරමි. ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ.
බේරුම්කරු,

2026 මාර්තු මස 05 දින දී ය.

EOG 06 - 0096

---

මගේ අංකය - IR/COM/02/2024/02

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.07.21 දිනැති හා අංක 2446/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.07.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හෝමාගම, මහකටුවාන පාර, අංක 573/9 හි පදිංචි ජී. එච්. එන්. ශ්‍යාමලී මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, කඩුවෙල පාර, අංක 475 හි පිහිටි ඉඩම් පතිසංස්කරණ කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 50/2025 හා 2026.03.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මැයි මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දීය**

ජී. එච්. එන්. ශ්‍යාමලී මිය,
අංක 573/9,
මහකටුවාන පාර,
හෝමාගම.

පැමිණිලිකරු

ආරාවුල් අංකය : IR/COM/02/2024/02
බේරුම්කරණ අංකය : A/50/2025

එදිරිව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

වගඋත්තරකරු

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :

“ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ III ශ්‍රේණියේ ගණකාධිකාරීවරියක් වශයෙන් සේවයේ නියුතුව සිටි ජී. එච්. එන්. ශ්‍යාමලී මියට නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කිරීමේ දී පහත සඳහන් කරුණු මත යම් අසාධාරණයක් සිදු වී තිබේ ද එසේ සිදු වී තිබේ නම් ඇයට හිමි විය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.

1. නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ තනතුර සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ දී කළමනාකරණ (මුදල්) II ශ්‍රේණියේ තනතුරක පිහිටුවා M M-1-1 හි II ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ පිහිටුවීම.

2. නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ අන්තර් ග්‍රහනය කිරීමේ දී පැමිණිලි පාර්ශ්වය හා සමාන මට්ටම්වල සිටි නිලධාරීන්ට වඩා පැමිණිලිකාරියට අසාමානව සැලකීම”

මෙම බේරුම්කරණ පරීක්ෂණයේ පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වන ජී. එච්. එන්. ශ්‍යාමලී මහත්මිය විසින් 2026.01.20 දිනැති ලිපිය මගින් සිය පෞද්ගලික හේතුවක් මත මෙම පරීක්ෂණය ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇත. එකී ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අයැද සිටිනුයේ ඉල්ලුම්කාරිය විසින් බේරුම්කරණය ගොනුකර ඇති ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කරන ලෙසත් සහ මෙම පරීක්ෂණය ඉල්ලා අස්කර ගැනීම සම්බන්ධයෙන් විරෝධයක් නොමැත බවත් ය. ඒ අනුව ඉල්ලුම්කාරියට මෙම පරීක්ෂණය ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා දෙන අතර පැමිණිල්ල මගින් ඉල්ලා ඇති සියලු සහන නිෂ්ප්‍රභා කරමි. ඒ අනුව මෙම පරීක්ෂණය අවසන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ,
බේරුම්කරු

2026 මාර්තු මස 05 දින දී ය.

E0G 06 - 0097

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.